වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

© 2025 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (03 වන මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

Info@erd.gov.lk
http://www.erd.gov.lk

අන්තර්ගතය

පිටු අංකය

04 පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ

09 පරිච්ඡේදය 02
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

23 පරිච්ඡේදය 03
වර්ෂය සමස්ථ මූල්‍ය කාර්යසාධනය

31 පරිච්ඡේදය 04
කාර්යසාධන දර්ශක

32 පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

34 පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

42 පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ ප්‍රධානම රජයේ දෙපාර්තමේන්තුව වන අතර එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. 2025 වසරේ දී අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක විය.

අංශයන්

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන, ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අංශය
- මැද පෙරදිග අංශය
- දකුණු අසියානු අංශය
- දියුණු ආර්ථික අංශය
- තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- අංශ සම්බන්ධීකරණ අංශය

සහය ඒකක

- පාලන අංශය
- ගිණුම් අංශය
- තොරතුරු තාක්ෂණ ඒකකය

1.2 ආයතනයේ, දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසාර සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශ සම්පත් ඵලදායී ලෙස සම්පාදනය කිරීම සහ කළමනාකරණය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන විදේශ සම්පත්, අත්දැකීම්, විශේෂඥ දැනුම සහ ගෝලීය දැනුම විදේශීය සංවර්ධන සහකරුවන්ගෙන් ලබා ගැනීම.

අරමුණු

- ජාතික සංවර්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන විදේශ සම්පත් සම්පාදනය කිරීම සඳහා විදේශ සංවර්ධන සහකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන වෙත අවශ්‍ය පහසුකම් හා සහාය සැපයීම.
- විදේශීය ධාරිතා සංවර්ධන අවස්ථා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සම්පාදනය කිරීම තුළින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට දායක වීම.
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1	සංවර්ධන සහාය උපායමාර්ගික දිශානති සහ ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා සංවර්ධන සහකරුවන් හා මූල්‍ය සපයන ආයතන සමඟ උපදේශන හා සාකච්ඡා පැවැත්වීම.
2	භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ඇතුළු රේඛීය අමාත්‍යාංශ හා ආයතන සමඟ උපදේශනයෙන්, සංවර්ධන සහකරුවන්ගේ වාර්ෂික රටේ හවුල්කාරීත්ව වැඩසටහන්කරණ (Annual Country Partnership Programming) ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
3	රාජ්‍ය ආයෝජන සැලැස්ම හා රාජ්‍ය ආයෝජන කමිටුවේ නිර්දේශයන්ට අනුගතව විදේශ මූල්‍යකරණය සඳහා ව්‍යාපෘති ලැයිස්තු සකස් කිරීම.
4	තොරතුරු සොයා බැලීමේ අදියරේ සිට ඇගයීම් අදියර දක්වා සංවර්ධන සහකරුවන්ගේ නියෝජිත කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
5	මූල්‍ය ආධාර පිළිබඳ සාකච්ඡා පැවැත්වීම, ණය/ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීම සඳහා කටයුතු සැලසීම සහ ඒවා බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා අදාළ වන ක්‍රියාකාරකම් වන්නේ: - සංවර්ධන සහකරුවන් සහ ණය සපයන ආයතන සමඟ ණය සාකච්ඡා පැවැත්වීම; - ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය රජයේ අනුමැති සහ බලය ලබා ගැනීම; - ණය ගිවිසුම් බලපැවැත්වීමට පෙර සම්පූර්ණ කළ යුතු කොන්දේසි ඉටු කිරීම.
6	සංවර්ධන සහකරුවන්ගේ මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, එනම්; - සංවර්ධන සහකරුවන් විසින් යොදවනු ලබන සමාලෝචන නියෝජිත කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා එම නියෝජිත කණ්ඩායම් විසින් නිර්දේශ කරනු ලබන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම.

	- විදේශ මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ විසින් පිහිටුවන ලද මෙහෙයුම් කමිටුවලට සහභාගී වීම හා සංවර්ධන සහකරුවන් සමඟ එක්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
7	තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යටතේ සංවර්ධන සහකරුවන් විසින් ලබාදෙන කෙටි කාලීන හා දිගු කාලීන විදේශීය පුහුණු අවස්ථා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා කළමනාකරණය කිරීම.
8	ලැබෙන විදේශීය පුහුණු අවස්ථා සහ එම අවස්ථාවලින් ප්‍රතිලාභ ලබන නිලධාරීන් සම්බන්ධ දත්ත සමුදායක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
9	රේඛීය අමාත්‍යාංශ හා ආයතන සමඟ සාකච්ඡා කරමින් විදේශීය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ හඳුනාගත් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් සංවර්ධන සහකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
10	ප්‍රදාන කැපවීම්, වියදම් සහ ප්‍රතිවිතරණ (Disbursement) තොරතුරු වාර්තාගත කිරීම හා පවත්වාගෙන යාම.
11	තිරසාර මූල්‍යකරණය සම්බන්ධ මූල්‍ය සම්පත් සම්පාදනය හා ව්‍යුහගත කිරීම.
12	විදේශ මූල්‍යකරණය ලබන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.
13	දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා සාමාන්‍ය පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම.

1.4 ආයතන ව්‍යුහය



සංවර්ධන නිලධාරී - 19

කළමනාකරණ සේවා නිලධාරී - 42

ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරී - 30

අ.අ.ජ - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අ - අධ්‍යක්ෂ
ස.අ./නි.අ. – සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
පරි.නි. - පරිපාලන නිලධාරී
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 හැඳින්වීම

2025 වර්ෂය ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා වැදගත් හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළ වසරක් විය. නිදහසින් පසු මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදය, රාජ්‍ය මූල්‍ය තත්ත්වය, විදේශ විනිමය සංචිත සහ ජනතාවගේ ජීවනෝපායන් කෙරෙහි අතිශය පීඩනයක් එල්ල කළ අභ්‍යන්තර හා බාහිර සාධක රැසක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ අතර, එම අභියෝගාත්මක තත්ත්වයෙන් පසු ආර්ථිකය ස්ථාවරත්වයට පත්වීමේ සහ නැවත ප්‍රතිශක්තිමත් වීමේ පැහැදිලි ලක්ෂණ පෙන්නුම් කළේ ය.

විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහාය යටතේ ක්‍රියාත්මක වන විස්තීරණ ණය පහසුකම් වැඩසටහන (Extended Fund Facility - EFF) තුළ සංවර්ධන සහකරුවන්ගේ අඛණ්ඩ සහාය සහ රජය විසින් ක්‍රියාත්මක කරන ලද අධිෂ්ඨානශීලී ප්‍රතිසංස්කරණ හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලිය මුලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගවත්ව හා ස්ථාවරව ඉදිරියට ගමන් කළේ ය.

2022 වසරේ මැද භාගයේදී ආරම්භ කරන ලද සහ 2023 වසරේ මැද භාගයේදී ආරම්භ වූ වසර හතරක IMF-EFF වැඩසටහන මත පදනම් වූ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මේ වන විට සැලකිය යුතු ප්‍රතිඵල ලබාදීමට සමත් වී ඇත. මෙම ප්‍රතිසංස්කරණ, ගැඹුරු ව්‍යුහාත්මක දුර්වලතා නිවැරදි කිරීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය යළි ස්ථාපිත කිරීම, මූල්‍ය විනය ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ණය තිරසාර මාර්ගයකට ගෙන ඒම යන අරමුණු මුල්කරගෙන ක්‍රියාත්මක කරන ලදී. 2025 වර්ෂයේ සිව්වන කාර්තුව තුළ දිට්වා සුළි කුණාටුව (Cyclone Ditwah) හේතුවෙන් යම් අභියෝග මතු වූ අතර, එය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සුළු බලපෑමක් ඇති කළ හැකි වුවද, සමස්තයක් වශයෙන් ආර්ථිකයේ ගමන් මඟ ධනාත්මක හා අනාගතය දෙස යොමුවූ දිශාවක් කරා යොමුව පැවතුණි.

එමෙන්ම, රජයේ පුළුල් ණය ප්‍රතිකාරකරණ (Debt Treatment) උපායමාර්ගයට අනුව ද්විපාර්ශ්වික බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සම්බන්ධයෙන්ද සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි විය. 2025 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික ණයවලින් සියයට 88.1ක් සාර්ථකව ප්‍රතිව්‍යුහගත කර තිබූ අතර, 2026 පෙබරවාරි මස අවසන් වන විට එම ප්‍රතිශතය සියයට 93 දක්වා ඉහළ ගොස් තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, අදාළ රාජ්‍ය ආයතන සමඟ උපදේශනයෙන්, නිල ද්විපාර්ශ්වික ණයහිමියන් සහ පත්කරන ලද ණය ප්‍රතිව්‍යුහගතකරණ උපදේශකවරුන් සමඟ සමීපව සම්බන්ධ වෙමින්, සමස්ත ක්‍රියාවලිය පුරා විවෘත, විනිවිදභාවයෙන් යුත් සහ ඵලදායී සංවාදයක් පවත්වාගෙන යන ලදී. මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය මධ්‍ය කාලීන ණය තිරසාරභාවය ශක්තිමත් කිරීම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ඉදිරියට ගමන් කිරීමේ දී, තිරසාර සහ දේශගුණික ප්‍රතිචාරාත්මක මූල්‍යකරණය ශ්‍රී ලංකාවේ විදේශ සම්පත් සම්පාදන උපායමාර්ගයේ වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. මේ සම්බන්ධයෙන්, ප්‍රමුඛතා දේශගුණික මූල්‍යකරණ විසඳුම් ප්‍රායෝගික ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික දේශගුණික මූල්‍යකරණ උපායමාර්ගය (2025–2030) සකස් කරන ලදී. මෙම උපායමාර්ගයේ අරමුණ වන්නේ දේශගුණික මූල්‍යකරණ හිඩැස පියවා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීම සහ ඒවා

කාර්යක්ෂමව යොමු කිරීම වන අතර, කාබන් ශුන්‍ය (Net-Zero Carbon) ඉලක්ක සහ පැරිස් ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කර ඇති ජාතිකව තීරණය කළ දායකත්වයන් (Nationally Determined Contributions - NDCs) සමඟ අනුකූල ව්‍යාපෘති සඳහා සහාය ලබාදීම ද එයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථික ගමන්මඟ තුළ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අත්කර ගත් ප්‍රගතිය තවදුරටත් ශක්තිමත් කරමින්, සංවර්ධන සහකරුවන් සමඟ හවුල්කාරීත්වය වර්ධනය කරමින් සහ ස්ථාවර, සර්ව සාධාරණ හා ප්‍රතිශක්තිමත් ආර්ථික ප්‍රතිසාධනයක් සඳහා නව්‍ය හා තිරසාර මූල්‍යකරණ විසඳුම් සම්පාදනය කිරීමේ කාර්යභාරය අඛණ්ඩව ඉටු කරනු ඇත.

2.2 ප්‍රගතිය

2.2.1. ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය

2025 වර්ෂය අවසන් වන විට, ජාතික ණය ප්‍රතිකාරකරණ උපායමාර්ගයේ කොටසක් ලෙස රජය සිය ද්විපාර්ශ්වික බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන තිබුණි. බාහිර සම්පත් දෙපාර්තමේන්තුව, නිල ද්විපාර්ශ්වික ණයහිමියන් සහ පත් කරන ලද ණය ප්‍රතිව්‍යුහගතකරණ උපදේශකවරුන් සමඟ සක්‍රියව සම්බන්ධ වෙමින්, ණය තිරසාරභාවය යළි ස්ථාපිත කිරීම සඳහා සමීපව කටයුතු කළ අතර, එම ක්‍රියාවලිය පුරා විවෘත, විනිවිදභාවයෙන් යුතු සහ ඵලදායී සංවාදයක් පවත්වාගෙන යන ලදී.

2025 වර්ෂය තුළ ණයහිමි රජයන් සහ ඔවුන්ගේ මූල්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය තවදුරටත් ශක්තිමත් කරන ලදී. සමස්ත ණය ප්‍රතිව්‍යුහගතකරණ රාමුව යටතේ එකඟ වූ පරාමිතීන්ට අනුකූලව සහ නිල ණයහිමි කමිටුව (Official Creditor Committee - OCC) සමඟ ස්ථාපිත කර ඇති සමාන ප්‍රතිකාරකරණ (Comparability of Treatment) මූලධර්මයන්ට අනුකූලව සාකච්ඡා පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම් කිහිපයක් සාර්ථකව අවසන් කිරීමට හැකි වූ අතර, ඉතිරි ණයහිමියන් සමඟ පවත්වන සාකච්ඡා අවසන් එකඟතාවකට ළඟාවීම සඳහා ස්ථාවර ලෙස ඉදිරියට ගමන් කරමින් පවතී.

2025 දෙසැම්බර් 31 දින වන විට, ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික ණයවලින් සියයට 88.1ක් ප්‍රතිව්‍යුහගත කර තිබුණි. මේ දක්වා ඇති කරගත් ගිවිසුම්, රටේ මධ්‍ය කාලීන ණය තිරසාරභාවය වැඩිදියුණු කිරීම සහ අඛණ්ඩ සාර්ව ආර්ථික ස්ථාවරකරණ ප්‍රයත්නයන්ට සහාය ලබා දීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සහ දැනට අත්කරගෙන ඇති ප්‍රතිලාභ තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, ඉතිරි ද්විපාර්ශ්වික හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය හා සාකච්ඡා 2026 වර්ෂය තුළ ද අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

2.2.2. තිරසාර මූල්‍යකරණය

ප්‍රායෝගිකත්වය, අනුවර්තනය වීමේ හැකියාව සහ ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු දේශගුණික ක්‍රියාමාර්ග උත්තේජනය කිරීමේ හැකියාව යන කරුණු පදනම් කරගෙන හඳුනාගත් ප්‍රමුඛතා දේශගුණික මූල්‍යකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික මූල්‍යකරණ උපායමාර්ගය (2025–2030) සකස් කරන ලදී. කාබන් ශුන්‍ය (Net-Zero Carbon) අරමුණු සහ පැරිස් ගිවිසුම යටතේ ජාතිකව නීර්ණය කළ දායකත්ව (Nationally Determined Contributions - NDCs) සාක්ෂාත් කරගැනීමට ඍජුව දායකවන ව්‍යාපෘති මූල්‍යයනය ඇතුළත්ව දේශගුණික මූල්‍යකරණ හිඟය පියවීම සඳහා මූල්‍ය සම්පත් එක්රැස් කිරීමට සහ යොමු කිරීමට එය සකසා ඇත. ඒ අනුව, මෙම උපායමාර්ගය ජාතික දේශගුණික ප්‍රමුඛතා ඉදිරියට ගෙන යාමට දායක වන අතර, ජාත්‍යන්තර දේශගුණික බැදීම් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීම තවදුරටත් තහවුරු කරයි.

පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම සඳහා දේශගුණික මූල්‍යකරණ උපකරණ 12ක් උපයෝගී කර ගනිමින්, මෙම උපායමාර්ගය මඟින් රජය මත පවතින මූල්‍ය බර අවම කරන අතර, එමඟින් ඇතිවන මූල්‍ය අවකාශය (Fiscal Space) සෞඛ්‍ය, අධ්‍යාපනය සහ දරිද්‍රතාව අවම කිරීම වැනි අනෙකුත් තීරණාත්මක සංවර්ධන අවශ්‍යතා සඳහා නැවත යොමු කළ හැකි වේ. මෙම උපායමාර්ගය යටතේ හඳුනාගෙන ඇති ප්‍රමුඛතා විසඳුම්

ක්‍රියාත්මක කිරීම සඳහා රජයට සහාය ලබාදීමට, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ඇතුළු සංවර්ධන සහකරුවන් කැමැත්ත පළ කර ඇත.

උපායමාර්ගයේ විසඳුම් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කෙරෙනු ඇත. 2025 වර්ෂය තුළ, හරිත චක්‍රීය අරමුදල (Green Revolving Fund - GRF) ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීමට සමගාමීව, ආපදා අවදානම් රක්ෂණ යාන්ත්‍රණයක් (Disaster Risk Insurance Mechanism) සඳහා සංකල්ප සටහනක් ද සකස් කරන ලදී. විශාල පරිමාණයෙන් ප්‍රාග්ධනය එක්රැස් කිරීම සහ යෙදවීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා දේශගුණික හා සොබාදහම-ප්‍රතිස්ථාපන ආයෝජන අරමුදල (Climate and Nature-Positive Investment Fund of Sri Lanka - CANOPI Fund) ස්ථාපිත කිරීම ද යෝජනා කර ඇත.



2.2.3. 2025 වර්ෂයේ පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන්වල කාර්යසාධනය

2025 වර්ෂය තුළ, විදේශ මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වූ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. මෙය ධාරිතා සංවර්ධනය සඳහා පවතින අඛණ්ඩ ඉල්ලුම සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ ආයතනික හා අංශමය අවශ්‍යතා ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීමේ හැකියාව පිළිබිඹු කරයි.

2025 වර්ෂය තුළ, පුහුණු වැඩසටහන් 741ක් සම්බන්ධීකරණය කරන ලද අතර, ඒවා අතරින් බහුතරයක් කෙටි කාලීන පුහුණු අවස්ථා වූ අතර, දිගු කාලීන වැඩසටහන් සංඛ්‍යාව සීමිත විය. මෙම වැඩසටහන් සඳහා අයදුම්පත් 3,087ක් ලැබී ඇති අතර, ඉන් 1,626 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා හිමි විය. කෙටි කාලීන පුහුණු වැඩසටහන් සමස්ත සහභාගීත්වයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් අතර, විශේෂයෙන් ජපානය සහ කොරියාව විසින් අනුග්‍රහය දක්වන ලද දිගු කාලීන වැඩසටහන් මානව සම්පත් සංවර්ධනය සඳහා වඩාත් ගැඹුරු හා දිගුකාලීන ආයෝජනයක් නියෝජනය කළේ ය.

රටවල් අනුව විශ්ලේෂණය කිරීමේදී, වැඩසටහන් සංඛ්‍යාව සහ අයදුම්කරුවන්ගේ ඉල්ලුම යන දෙඅංශයෙන්ම චීනය ප්‍රමුඛ හවුල්කරු ලෙස පවතින අතර, ඉන්දියාව දෙවන ස්ථානය හිමි කර ගත්තේය. මෙම රටවල් දෙක එක්ව සමස්ත පුහුණු වැඩසටහන් අවස්ථාවලින් සියයට 57කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කළ අතර, එය දෙරට අතර පවතින ශක්තිමත් ද්විපාර්ශ්වික සහයෝගිතාවය පිළිබිඹු කරයි. චීනය විසින් ඉතා ඉහළ තේරීම් අනුපාතයක් වාර්තා කළ අතර, කොරියාව සහ ජපානය ද පුහුණු වැඩසටහන් සහ අපේක්ෂකයන්ගේ සුදුසුකම් අතර ඉහළ ගැළපීමක් පෙන්නුම් කරමින් ශක්තිමත් සහ ස්ථාවර කාර්යසාධනයක් පවත්වාගෙන ගියේය. ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි බහුපාර්ශ්වික සංවර්ධන සහකරුවන් සහ කොළඹ සැලැස්ම (Colombo Plan) වැනි කලාපීය වැඩසටහන් යටතේ ලබා දී ඇති පුහුණු අවස්ථාවන් සම්පූර්ණයෙන්ම පාහේ ප්‍රයෝජනයට ගෙන තිබූ අතර, එය මෙම අවස්ථා සම්බන්ධයෙන් සිදුකරන ලද ඵලදායී සම්බන්ධීකරණය මනාව පිළිබිඹු කරයි.

අංශ අනුව වැඩසටහන් බෙදා හැරීම විශ්ලේෂණය කිරීමේ දී, ප්‍රධාන සංවර්ධන ප්‍රමුඛතා කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොමු කර ඇති බව පෙනී යයි. පාලන සහ රාජ්‍ය පරිපාලන අංශය (වැඩසටහන් 107ක්) වැඩිම පුහුණු අවස්ථා සංඛ්‍යාවක් හිමි කරගෙන ඇති අතර, සමාජ ආරක්ෂණ අංශය (වැඩසටහන් 98ක්) දෙවන ස්ථානයට පත්ව තිබේ. මෙය ආයතනික ශක්තිමත්කරණය සහ සමාජ සුබසාධන පද්ධති සංවර්ධනය කෙරෙහි ලබා දී ඇති ප්‍රමුඛත්වය පිළිබිඹු කරයි. ඩිජිටල් ආර්ථිකය සහ ජනමාධ්‍ය අංශය (වැඩසටහන් 67ක්) මෙන්ම මූල්‍ය හා ආර්ථික කළමනාකරණ අංශය (වැඩසටහන් 67ක්) ද සැලකිය යුතු සහභාගීත්වයක් වාර්තා කර ඇති අතර, කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන අංශය (වැඩසටහන් 60 ක්) ප්‍රාථමික අංශයේ නවීකරණය සහ ජාතික ආහාර සුරක්ෂිතතා අරමුණු සාක්ෂාත් කර ගැනීමට අඛණ්ඩව දායක වී ඇත.

අංශමය හවුල්කාරීත්වයන් විශ්ලේෂණය කිරීමේ දී, සංවර්ධන සහකරුවන් අතර විශේෂිත සාපේක්ෂ වාසි පැහැදිලිව දක්නට ලැබේ. ඉන්දියාව වඩාත් බහුකාර්ය සංවර්ධන සහකරු ලෙස ඉස්මතු වූ අතර, පාලන හා රාජ්‍ය පරිපාලන, ඩිජිටල් ආර්ථිකය සහ සමාජ ආරක්ෂණ යන අංශවල ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේ ය. ජපානය සමාජ ආරක්ෂණ සහ කෘෂිකර්ම අංශ කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොමු කළ අතර, ආසියානු සංවර්ධන බැංකුව (ADB) මූල්‍ය හා ආර්ථික කළමනාකරණ ක්ෂේත්‍රයේ වැඩසටහන්වලින් බහුතරයකට දායක වෙමින්, මූල්‍ය අංශයට ඉහළ විශේෂීකරණ සහායක් ලබා දුන්නේ ය. චීනය ද විවිධ අංශයන් හරහා ස්ථාවර දායකත්වයක් පවත්වාගෙන ගිය අතර, විශේෂයෙන් පාලන හා රාජ්‍ය පරිපාලන සහ සමාජ ආරක්ෂණ අංශවල සැලකිය යුතු මැදිහත්වීමක් පෙන්නුම් කළේ ය.

සමස්තයක් වශයෙන්, 2025 වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය, වැඩසටහන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා පවත්වාගෙන යාම සහ ජාත්‍යන්තර පුහුණු අවස්ථා ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතා සමඟ මනා ලෙස ගැළපීම පිළිබිඹු කරයි.

2.2.4. විදේශ මූල්‍යයන එකතුව

2025 ජනවාරි මස සිට 2025 දෙසැම්බර් මස අවසානය දක්වා කාලය තුළ, විදේශ මූල්‍යකරණය සම්පාදනය කිරීම සඳහා රජය විසින් විදේශ සංවර්ධන සහකරුවන් හා ණය සපයන ආයතන සමඟ ගිවිසුම් 29කට එළඹුණු අතර, එමඟින් ඇමරිකානු ඩොලර් මිලියන 1,780.87ක විදේශ මූල්‍යකරණ කැපවීම් ලබා ගන්නා ලදී. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 1,703.6ක් ණය වශයෙන් කැපවී තිබුණි. සමස්ත ණය ප්‍රමාණයෙන්, ඇමරිකානු ඩොලර් මිලියන 790ක් ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් සහ ඇමරිකානු ඩොලර් මිලියන 681.6ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් ලබා ගන්නා ලදී.

ණය ගිවිසුම්වලට අමතරව, ජපාන රජය, ඉන්දීය රජය, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ යුරෝපා සංගමය ඇතුළු සංවර්ධන සහකරුවන් සමඟ අත්සන් කරන ලද ප්‍රදාන ගිවිසුම් 16ක් මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 77.27ක ප්‍රදාන මූල්‍යකරණ කැපවීම් ලබා ගන්නා ලදී.

මුළු එකතුව	විදේශ ණය	විදේශ ප්‍රදාන
ඇ.එ.ජ.ඩො. මිලියන	*ඇ.එ.ජ.ඩො. මිලියන*	*ඇ.එ.ජ.ඩො. මිලියන*
1,780.87	**1,703.6**	**77.27**

විදේශ මූල්‍යයන එකතුව 2025, සංවර්ධන පාර්ශ්වකරු අනුව

සංවර්ධන පාර්ශ්වකරු	වටිනාකම (ඇ.එ.ජ.ඩො. මිලියන)		
	ණය	ප්‍රදාන	එකතුව
ද්වීපාර්ශ්වීය	-	**46.41**	**46.41**
ජපානය	-	10.42	10.42
කොරියාව	-	8.5	8.5
ඉන්දියාව	-	27.49	27.49
බහුපාර්ශ්වීය	**1,703.6**	**30.86**	**1,734.46**
ආසියානු සංවර්ධන බැංකුව	790	6	796
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	681.6	-	681.6
ලෝක බැංකුව	180	6.2	186.2
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	52	-	52
යුරෝපා සංගමය	-	18.66	18.66
එකතුව	**1,703.6**	**77.27**	**1,780.87**

2025 වර්ෂයේ සංවර්ධන සහකරුවන් විසින් සිදුකරන ලද මූල්‍යකරණ කැපවීම් (ඇ.ඩො. මිලියන)



2025 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ ණය බැඳීම් හා කොන්දේසි පිළිබඳ විස්තර

	සංවර්ධන හවුල්කරු	ණය	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)			මූල්‍ය කොන්දේසි			වෙනත් ගාස්තු	අනෙකුත් කොන්දේසි	
								පොලී අනුපාතිකය					
					මුදල් ඒකකය	මූල්‍ය උපකරණයේ මුදල් ඒකකයෙන්	ඇ.එ.ජ.ඩො.	වර්ගය	වාර්ෂික අනුපාතිකය (%)	අතිරේක පොළී අනුපාතිකය (පදනම් අංක 100)		සහන කාලය (වසර)	අත්සන් කළ දින සිට කල්පිරීමෙ / ලබාගත හැකි කාලසීමාව (වසර)
1	ලෝක බැංකුව	ණය	2025.09.08	ඒකාබද්ධ ග්‍රාමීය නාගරික සංවර්ධන හා දේශගුණික ප්‍රතිරෝධතා ව්‍යාපෘතිය	ඇ.ඩො.	100	100	විචල්‍ය	1.25% + පදනම් අනුපාතික ගැලපීම	අදාළ නොවේ	**කැපවීම් ගාස්තුව -** ලබා නොගත් මූල්‍යකරණ ශේෂය මත වාර්ෂිකව 0.5% (1/2%) **සේවා ගාස්තුව -** වාර්ෂිකව 0.75% + පදනම් අනුපාතික ගැලපීම	5	30
2	ලෝක බැංකුව	ණය	2025.12.03	සුරක්ෂිත, දැරිය හැකි හා තිරසාර බලශක්ති ව්‍යාපෘතිය	ඇ.ඩො.	30	30	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	ලබා නොගත් මූල්‍යකරණ ශේෂය මත වාර්ෂිකව සියයට ½%ක කැපවීම් ගාස්තුවක්	6	12
3	ලෝක බැංකුව	ණය	2025.12.19	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය – අතිරේක මූල්‍යකරණය	ඇ.ඩො.	50	50	විචල්‍ය	A කොටස – වාර්ෂිකව 1.25% + පදනම් අනුපාතික ගැලපීම. B කොටස – අදාළ නොවේ	අදාළ නොවේ	**කැපවීම් ගාස්තුව-** ලබා නොගත් මූල්‍යකරණ ශේෂය මත වාර්ෂිකව 0.5% (½%) **සේවා ගාස්තුව-** A කොටස – වාර්ෂිකව 0.75% + පදනම් අනුපාතික ගැලපීම B කොටස – අදාළ නොවේ	A කොටස - 5 B කොටස - 6	A කොටස -30 B කොටස -12

	සංවර්ධන හවුල්කරු	ණය	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)			මූල්‍ය කොන්දේසි				අනෙකුත් කොන්දේසි	
					මුදල් ඒකකය	මූල්‍ය උපකරණයේ මුදල් ඒකකයෙන්	ඇ.එ.ජ.ඩො.	පොලී අනුපාතිකය			වෙනත් ගාස්තු	සහන කාලය (වසර)	අත්සන් කළ දින සිට කල්පිරීමේ / ලබාගත හැකි
								වර්ගය	වාර්ෂික අනුපාතිකය (%)	අතිරේක පොලී අනුපාතිකය (පදනම් අංක 100)			
4	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	ණය		ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	ඇ.ඩො.	681.6	681.6						
5	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.12.05	විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ හා මූල්‍ය තිරසාරත්ව වැඩසටහන (උප වැඩසටහන 2)	ඇ.ඩො.	100	100	විචල්‍ය	SOFR+0.5	-	කැපවීම් ගාස්තුව 0.15%	3	15
6	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.11.17	මූල්‍ය ක්ෂේත්‍ර ස්ථාවරතාව සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන (උප වැඩසටහන 3)	ඇ.ඩො.	100	100	ස්ථාවර	2	-	-	5	25
7	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.11.17	සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරදෘශ්‍යභාවය ශක්තිමත් කිරීමේ වැඩසටහන (උප වැඩසටහන 1)	ඇ.ඩො.	100	100	ස්ථාවර	2	-	-	5	25
8	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.11.17	තිරසාර සංචාරක ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන (උප වැඩසටහන 1)	ඇ.ඩො.	70	70	ස්ථාවර	2	-	-	5	25
					ඇ.ඩො.	30	30	විචල්‍ය	SOFR+0.5	0.10%	කැපවීම් ගාස්තුව 0.15% කල්පිරීමේ වාරිකය 0.1%	5	25

	සංවර්ධන හවුල්කරු	ණය	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)			මූල්‍ය කොන්දේසි			වෙනත් ගාස්තු	අනෙකුත් කොන්දේසි	
								පොලී අනුපාතිකය					
					මුදල් ඒකකය	මූල්‍ය උපකරණයේ මුදල් ඒකකයෙන්	ඇ.එ.ජ.ඩො.	වර්ගය	වාර්ෂික අනුපාතික ය (%)	අතිරේක පොලී අනුපාතිකය (පදනම් අංක 100)		සහන කාලය (වසර)	අවසන් කළ යුතු කාලසීමාව /
9	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.10.17	සර්වජන සෞඛ්‍ය ආවරණය ළඟා කර ගැනීම සඳහා ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සහ පාලන පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩසටහන	ඇ.ඩො.	100	100	විචල්‍ය	SOFR+0.5	0.10%	කැපවීම් ගාස්තුව 0.15%	5	26
10	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.10.31	දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoads) – 5 වන අදියර	ඇ.ඩො.	90	90	විචල්‍ය	SOFR+0.5	0.20%	කැපවීම් ගාස්තුව 0.15%	8	29
11	ආසියානු සංවර්ධන බැංකුව	ණය	2025.12.15	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (දෙවන අදියර) ව්‍යාපෘතිය	ඇ.ඩො.	200	200	විචල්‍ය	SOFR+0.5	0.10%	කැපවීම් ගාස්තුව 0.15%	5	25
12	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)	ණය	2025.10.07	කෙරවලපිටිය – වරාය 'L' දෙවන සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය	ඇ.ඩො.	52	52	විචල්‍ය අතිරේක අනුපාතිකය	මාස 6ක USD SOFR අනුපාතිකය + විචල්‍ය අතිරේක අනුපාතිකය - වාර්ෂිකව 1%	-	**මුල් ගාස්තුව** - ණය මුදලෙන් 0.25% **කැපවීම් ගාස්තුව** - ලබා නොගත් ණය මුදල මත වාර්ෂිකව 0.25%	5	25 (සහන කාලය ඇතුළු)
මුළු ණය මුදල							**1,703.6**						

2025 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වූ විදේශ ප්‍රදාන පිළිබඳ විස්තර

	සංවර්ධන සහකරු	ප්‍රදාන	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)		
					මුදල් ඒකකය	මුදල් ඒකකය	මුදල් ඒකකය
1	ජපාන රජය	ප්‍රදාන	03.02.2025	ජපාන රජයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ කසළ සම්පීඩක රථ 28ක් ලබාගැනීම සඳහා වූ ප්‍රදාන ආධාර ව්‍යාපෘතිය	ජපන් යෙන්	300	1.92
2	ජපාන රජය	ප්‍රදාන	20.03.2025	ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ආයෝජන මණ්ඩලයේ (BOI) අපනයන සැකසුම් කලාපවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගිනි නිවීමේ ඒකක පිහිටුවීම හා උපකරණ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය	ජපන් යෙන්	300	2.02
3	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA)	ප්‍රදාන	29.09.2025	කිරි කර්මාන්තයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ජපන් යෙන්	463	3.13
4	ජපාන තානාපති කාර්යාලය	ප්‍රදාන	29.09.2025	ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා නිල ආරක්ෂක සහාය (OSA)	ජපන් යෙන්	500	3.35
5	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA)	ප්‍රදාන	03.07.2025	කොළඹ මහ නගර සභාව සඳහා බදු පරිපාලන තොරතුරු තාක්ෂණ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සහ E-Tax පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	8.5	8.5
6	ඉන්දියානු රජය	ප්‍රදාන	15.01.2025	උතුරු පළාතේ ශ්‍රී ලංකා පොලිස් ස්ථාන සඳහා සිංගල් කැබ් රථ 80ක් සැපයීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	1	1

	සංවර්ධන සහකරු	ප්‍රදාන	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)		
					වටිනාකම (මිලියන)	සංවර්ධන සහකරු	ප්‍රදාන
7	ඉන්දියානු රජය	ප්‍රදාන	16.01.2025	නුවරඑළිය, මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්කවල ස්මාර්ට් පන්තිකාමර 60ක් පිහිටුවීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	1.69	1.69
8	ඉන්දියානු රජය	ප්‍රදාන	20.03.2025	මාහෝ – අනුරාධපුර දුම්රිය මාර්ගයේ සංඥා සහ දුරසන්නිවේදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	14.9	14.9
9	ඉන්දියානු රජය	ප්‍රදාන	05.04.2025	නැගෙනහිර පළාත සඳහා ඉන්දීය බහු අංශීය ප්‍රදාන ආධාරය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	7.9	7.9
10	ඉන්දියානු රජය	ප්‍රදාන	09.09.2025	මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	2	2
11	යුරෝපා සංගමය	ප්‍රදාන	23.09.2025	ජෛව විවිධත්ව සංරක්ෂණය සහ අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් තිරසාර ආර්ථික ප්‍රතිසාධනයට සහාය වීමේ ව්‍යාපෘතිය	යුරෝ	8	9.27
12	යුරෝපා සංගමය	ප්‍රදාන	17.12.2025	AgriGreen වැඩසටහන – තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේදයන් හරහා හරිත ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	යුරෝ	8	9.39
13	ආසියානු සංවර්ධන බැංකුව	ප්‍රදාන	05.12.2025	දිට්වා සුළි කුණාටු හදිසි ප්‍රතිචාර ව්‍යාපෘතිය	ඇ.ඩො.	3	3
14	ආසියානු සංවර්ධන බැංකුව	ප්‍රදාන	19.12.2025	ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සඳහා වාරිමාර්ග පද්ධති පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	3	3

	සංවර්ධන සහකරු	ප්‍රදාන	ගිවිසුම් දිනය	ව්‍යාපෘතිය / වැඩසටහන / මූල්‍ය උපකරණයේ නම	වටිනාකම (මිලියන)		
					වටිනාකම (මිලියන)	සංවර්ධන සහකරු	ප්‍රදාන
15	ලෝක බැංකුව	ප්‍රදාන	31.10.2025	ශ්‍රී ලංකාවේ වරාය සහ ලොජිස්ටික්ස් අංශයේ සංවර්ධනය සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය	ඇ.ඩො.	3	3
16	ලෝක බැංකුව	ප්‍රදාන	29.08.2025	උරුම සංරක්ෂණය, ඔරොත්තු දීමේ හැකියාව, සමාජ ඇතුළත්භාවය සහ වටිනාකම් මත පදනම් වූ රැකියා උත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සංචාරක ව්‍යාපෘතිය	SDR වි.ගැ.හි.	1.63	2.2
17	ලෝක බැංකුව	ප්‍රදාන	29.08.2025	උතුරු හා නැගෙනහිර පළාත් සඳහා වූ ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (IRDP)	SDR වි.ගැ.හි.	0.74	1
මුළු ප්‍රදාන මුදල							**77.27**

2.2.5. විදේශ ප්‍රදාන මූල්‍යකරණයේ මුදාහැරීම් හා උපයෝජනය

2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විදේශ ප්‍රදාන මූල්‍යකරණය යටතේ මුදාහැරීම්වල මුළු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 119.87ක් ලෙස වාර්තා විය.

ප්‍රධාන ප්‍රදාන සපයන්නන්

චීන රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 29.54ක ප්‍රදාන ලබාදෙමින් ප්‍රධානතම ප්‍රදාන සපයන්නා බවට පත් වූ අතර, එය පහත පරිදි අනෙකුත් ප්‍රධාන දායකයන් විසින් අනුගමනය කරන ලදී:

- **ඇමරිකා එක්සත් ජනපදය (USDA සහ USAID) – ඇමරිකානු ඩොලර් මිලියන 23.27**
- **ඉන්දීය රජය – ඇමරිකානු ඩොලර් මිලියන 16.1**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ ප්‍රදාන මුදාහැරීම්

(ඇ.එ.ජ.ඩො. මිලියන)

ද්විපාර්ශික	සංවර්ධන සහකරු	ප්‍රදාන
		92.58
	ජපාන රජය	-
	කොරියානු ජනරජයේ රජය	9.15
	අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල	-
	චීන රජය	29.54
	ඇමරිකා එක්සත් ජනපදය (USDA සහ USAID)	23.27
	ඕස්ට්‍රේලියානු රජය	5.46
	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)	5.36
	ජර්මනිය (GIZ සහ අනෙකුත් ආයතන)	3.11
	එක්සත් රාජධානිය (UK)	0.38
	ඉන්දීය ජනරජයේ රජය	16.18
	අනෙකුත් (නෝර්වේ රජය, ස්විට්සර්ලන්තය සහ නවසීලන්තය)	0.13
	Co-op Centrale Raiffeisen (නෙදර්ලන්තය)	8.14
බහුපාර්ශ්වික		**19.15**
	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	1.83
	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)	-
	යුරෝපීය ආයෝජන බැංකුව (EIB)	-
	ලෝක බැංකුව (WB)	5.15
	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD)	-
	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)	-
	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ OPEC අරමුදල (OFID)	-
	එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN)	9.28
	ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනය (IAEA)	0.26

යුරෝපා සංගමය (EU)	0.75
අනෙකුත් (GCF, APO සහ SAARC)	1.88
මුළු එකතුව	**119.87**

මූලාශ්‍රය : රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව (ප්‍රදාන)

සටහන : සියලුම ඇමරිකානු ඩොලර් (USD) අගයන් 2025 වර්ෂය සඳහා වූ සාමාන්‍ය විනිමය අනුපාතය වන ඇ.ඩො. 1 = රුපියල් 300 යන අනුපාතය මත පරිවර්තනය කර ඇත.

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සංවර්ධන සහකරු අනුව ප්‍රදාන මුදාහැරීම



2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ සමස්ත

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	රු. සත්‍ය 2025	සත්‍ය 2024	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		2,686,296,465	2,735,223,085	ඒසීඒ-3
-	තැන්පතු		112,908	889,227	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		10,756,480	7,236551	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**2,697,165,853**	**2,743,456,863**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**2,697,165,853**	**2,743,456,863**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		7,930,413	4,892,698	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**2,689,235,441**	**2,738,564,165**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	

143,813,700	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	122,009,124	117,413,304	
79,347,300	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	54,676,981	58,923,901	**ඒසීඒ-2(ii)**
93,839,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	88,261,019	118,678,256	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
317,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**262,947,124**	**295,015,461**	
	මූලධන වියදම්				
5,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	723,972	126,588	
143,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	17,400,728	17,931,590	
2,512,800,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	2,403,628,871	2,419,468,761	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
580,000,000	හැකියා වර්ධනය	14	1,629,292	567,808	
-	වෙනත් මූලධන වියදම්	15	578,000,000	639,030,567	
3,241,500,000	මුළු මූලධන වියදම් (උ)		**3,001,382,862**	**3,077,125,314**	
	තැන්පතු ගෙවීම්		112,908	889,227	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		8,193,598	10,063,519	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		**8,306,507**	**10,952,746**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,272,636,493	3,383,093,521	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(583,401,052)**	**(644,529,356)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(583,401,052)**	**(644,529,356)**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**-**	**-**	ඒසීඒ-3
			(583,401,052)	**(644,529,356)**	

3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	191,375,724	188,797,849
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	17,816,025	20,378,907
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**209,191,749**	**209,176,756**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		17,816,025	20,378,907
දේපළ පිරියත හා උපකරණ සංචිතය		191,375,724	188,797,849
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**209,191,749**	**209,176,756**

පිටු අංක 07 සිට 32 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම : 2026.02.20	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026-02-24	දිනය :	දිනය : 2026.02.20
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ - 01	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර අධ්‍යක්ෂ ජනරාල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.	ඩබ්.එස්. ප්‍රියදර්ශනී ද මැල් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් - වැ.බ.) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සත්‍ය	
	2025	2024
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	578,000,000	639,030,567
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	7,066,702	5,658,321
අග්‍රිම ලැබීම්	2,686,296,465	2,735,331,085
අත්තිකාරම් අයකර ගැනීම්	8,822,124	6,985,490
තැන්පතු ලැබීම්	112,908	889,227
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,280,298,199**	**3,387,894,690**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	176,188,105	175,673,679
සහනාධාර සහ මාරුකිරීම්	86,261,019	118,678,256
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	2,983,982,134	3,059,193,724
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	229,654	571,996
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	7,930,413	4,892,698
අත්තිකාරම් ගෙවීම්	8,193,238	10,063,519
තැන්පතු ගෙවීම්	112,908	889,227
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,262,897,472**	**3,369,963,099**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,400,728**	**17,931,590**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	
	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-

උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	17,400,728	17,931,590
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	17,400,728	17,931,590
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(17,400,728)	(17,931,590)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(17,400,728)**	**(17,931,590)**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>***අඩුකළා : මුදල් වැය කිරීම්***</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.5 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	මුදල් ඇස්තමේන්තුව
අදාළ නොවේ					

3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ ප්‍රතිපාදන

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	317,000,000	317,000,000	262,947,124	83%
ප්‍රාග්ධන	3,241,500,000	3,241,500,000	3,001,382,862	93%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාළ නොවේ						

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2025** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2025** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ හා උපකරණ		165,669,330		
9154	අනෙකුත් මූල්‍ය නොවන අස්පර්ශනීය වත්කම්		25,706,394		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන 2025 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

පරිච්ඡේදය 04

කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මූල්‍ය එකඟතා	101		
මූල්‍ය උපයෝජන (ප්‍රදාන)	154		
තාක්ෂණික පුහුණු අවස්ථාවන් (නිලධාරීන් ගණන)	108		

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය (SDG)

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	ඇ.එ.ජ.ඩො මිලියන 361.02	ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය (නිල සංවර්ධන ආධාර, සෘජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ත සම්පත් ගලනය *ලද ප්‍රමාණය:* ඇ.එ.ජ.ඩො.මිලියන: 203.4		56	
සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ඇ.එ.ජ.ඩො මිලියන 504.3	යටිතල පහසකම් සඳහා වන සමස්ත නිල ජාත්‍යන්තර සහාය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල වශයෙන් ලැබෙන සැපයුම්) *ලද ප්‍රමාණය: :* *ඇ.එ.ජ.ඩො.මිලියන* 175.85	35		
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	1500	ක්ෂේත්‍රය සහ ඉගෙනුම් ආකාරය අනුව, ශිෂ්‍යත්ව සඳහා නිල සංවර්ධන ආධාර ගලා යාමේ ප්‍රමාණය ලැබුණු අවස්ථා ගණන: (1626)			108

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

සංවර්ධන සහකරුවන් විසින් වාර්ෂිකව විදේශ මුල්‍ය කැපවීම් සිදු කරනු ලබන අතර, ඒවා සමස්ත කැපවීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, එම කැපවූ අරමුදල් කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, නිපුණතා සංවර්ධනය, අධ්‍යාපනය, දරිද්‍රතා අවම කිරීම, මාර්ග හා මහාමාර්ග, නාගරික සංවර්ධනය, සෞඛ්‍යය සහ අනෙකුත් ප්‍රමුඛ සංවර්ධන ක්ෂේත්‍රවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදාහරිනු ලැබේ.

කෙසේ වෙතත්, පාරිසරික නිෂ්කාශන ලබාගැනීම, ඉඩම් අත්පත් කරගැනීම, උපයෝගිතා සේවා මාරු කිරීම, ජනතාව නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, දේපළ තක්සේරු කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළු ව්‍යාපෘති සූදානමට අදාළ කරුණු හේතුවෙන්, සැලසුම් කළ පරිදි අරමුදල් මුදාහැරීම් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වන අවස්ථා පවතී.

2025 වර්ෂයේ පළමු කාර්තුව ගිණුම් මත ඡන්දය (Vote on Account) යටතේ ක්‍රියාත්මක වූ අතර, එම වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය 2025 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන වියදම් යටතේ වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 76ක පමණ ප්‍රගතියක් පමණක් අත්කර ගැනීමට හැකි විය. මෙම තත්ත්වය එම වර්ෂය සඳහා සැලසුම් කර තිබූ අරමුදල් මුදාහැරීම් ඉලක්කය සපුරා ගැනීමට අහිතකර ලෙස බලපෑවේ ය.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	41	28	13
තෘතීයික	03	02	01
ද්විතියික	62	53	09
ප්‍රාථමික	30	23	07

6.2. **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ විවිධ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගෙන් මූල්‍ය සම්පත් ලබාගැනීමයි. එම සංවර්ධන හවුල්කරුවන්ගේ මූල්‍යකරණ ක්‍රමවේද, නීති හා අවශ්‍යතා එකිනෙකට වෙනස් වන අතර, එවැනි මූල්‍යකරණ කටයුතු අමාත්‍ය මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළු අදාළ ආයතන රැසක අනුමැතියට යටත් වේ. මෙම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සාකච්ඡා හා සන්නිවේදන කුසලතා, භාෂා ප්‍රවීණතාව, ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, සංඛ්‍යාන විද්‍යාව, ව්‍යාපෘති සැලසුම්කරණය හා සකස් කිරීම, ණය කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහිත නිලධාරීන් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, පුහුණුව ලැබූ නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය යටතේ වෙනත් ආයතන වෙත මාරු කරනු ලබන අතර, ඒ වෙනුවට නව නිලධාරීන් පත් කරනු ලැබේ. එම නිලධාරීන් අතර අවශ්‍ය දැනුම හා කුසලතා සහිත පුද්ගලයන් සොයා ගැනීම අභියෝගාත්මක වන අතර, නව නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ අත්දැකීමක් ලබා ගැනීමට සාමාන්‍යයෙන් වසර දෙකක පමණ කාලයක් ගත වේ. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනයට සැලකිය යුතු බලපෑමක් එල්ල කරයි..

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය/ විදේශීය	මුදල (රු.)		
ශාස්ත්‍රපති උපාධි වැඩසටහන	1	2025 ජනවාරි 08 – 2026 දෙසැම්බර් 31	විදේශීය	75,801.06	විදේශයක	අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ උසස් මට්ටමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා ගැනීම
ශාස්ත්‍රපති උපාධි වැඩසටහන	1	2025 ජනවාරි 10– 2027 ජනවාරි 02	විදේශීය	75,737.04	විදේශයක	අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් උසස් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ප්‍රදර්ශනය කිරීම
දේශගුණික ක්‍රියාමාර්ග සඳහා පරිත්‍යාගශීලීත්වය පිළිබඳ ඉගෙනුම් වැඩමුළුව	1	පෙබවාරි 27 – 28	විදේශීය	22,723.75	විදේශයක	දේශගුණික ක්‍රියාමාර්ග සහ තිරසාර සංවර්ධනය සඳහා පරිත්‍යාගශීලී මූල්‍යකරණය, හවුල්කාරිත්ව ආකෘති සහ නව්‍ය මූල්‍යකරණ ප්‍රවේශයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදනය සමඟ සම්බන්ධ කිරීම" පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන	1	මාර්තු 17 – 28	විදේශීය	113,544.94	විදේශයක	පර්යේෂණ සාක්ෂි ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති බවට පරිවර්තනය කිරීම, ප්‍රතිපත්ති විශ්ලේෂණය, පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම පිළිබඳ දැනුම ලබා ගැනීම
ජල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තායිලන්තයේ අධ්‍යයන සංචාරයක් පැවැත්වීම	1	පෙබරවාරි 24 – 28	විදේශීය	45,389.05	විදේශයක	තායිලන්තයේ ජල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ආයතනික සම්බන්ධීකරණය, නියාමන රාමු සහ ජල සම්පත් කළමනාකරණයේ හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
සාර්ව ආර්ථික රාමු තුළ දේශගුණික කරුණු ඒකාබද්ධ කිරීම පිළිබඳ IMF SARTTAC පුහුණු වැඩසටහන	1	අප්‍රේල් 28 – මැයි 02	විදේශීය	–	විදේශයක	සාර්ව ආර්ථික රාමු තුළ දේශගුණික කරුණු ඇතුළත් කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම

එක්සත් ජනපද ජාත්‍යන්තර අමුත්තන්ගේ නායකත්ව වැඩසටහන (IVLP)	1	මැයි 19 – ජූනි 06	විදේශීය	114,578.40	විදේශයක	ඇමරිකානු ආයතන සහ විශේෂඥයන් සමඟ සෘජු සම්බන්ධතාවය හරහා එක්සත් ජනපදයේ පාලන ක්‍රමය හා සමාජය, නායකත්වය හා ප්‍රතිපත්තිමය භාවිතයන්, ජාත්‍යන්තර සහයෝගීතාව සහ වෘත්තීය දැනුම් හුවමාරුව පිළිබඳ දැනුම ලබා ගැනීම
2025 ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) නරඹන්නන්ගේ වැඩසටහන	1	අප්‍රේල් 06 – 18	විදේශීය	136,095.49	විදේශයක	බහුපාර්ශ්වික සංවර්ධන බැංකුකරණය, යටිතල පහසුකම් මූල්‍යකරණය, ව්‍යාපෘති ඇගයීම, පාලන ක්‍රමවේද සහ තිරසාර සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
ශ්‍රී ලංකාවේ සංවර්ධන කලාප ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	1	අප්‍රේල් 28 – මැයි 13	විදේශීය	118,584.37	විදේශයක	ශ්‍රී ලංකාවේ සංවර්ධන කලාප ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා මැලේසියාවට යෝජිත අධ්‍යයන සංචාරය	1	මැයි 13 – 15	විදේශීය	30,590.00	විදේශයක	මැලේසියාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද, මූල්‍ය ප්‍රතිපත්ති රාමු, සංවර්ධන මූල්‍යකරණ යාන්ත්‍රණ සහ භාණ්ඩාගාර කටයුතු සඳහා අදාළ ආයතනික හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ 4 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	1	ජූනි 28 – ජූලි 05	විදේශීය	53,668.40	විදේශයක	එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධනය සඳහා වන ගෝලීය මූල්‍යකරණ රාමු, තිරසාර සංවර්ධන මූල්‍යකරණය, ජාත්‍යන්තර සහයෝගීතාව සහ සංවර්ධන මූල්‍යකරණ අභියෝග සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර පිළිබඳ දැනුම ලබා ගැනීම
ශ්‍රී ලංකාවේ රාජ්‍ය නවෝත්පාදනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන	1	ජූලි 14 – 22	විදේශීය	84,587.67	විදේශයක	රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා නව්‍ය රාජ්‍ය අංශ භාවිතයන්, ඩිජිටල් පරිවර්තනය, ප්‍රතිපත්ති නවෝත්පාදනය සහ වෙනස්කම් කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
බලශක්ති සංක්‍රාන්තිය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම: කොරියානු ජනරජයේ හරිත බලශක්ති අත්දැකීම් පිළිබඳ දැනුම් හුවමාරු වැඩසටහන	1	ජූනි 16 – 20	විදේශීය	57,095.35	විදේශයක	කොරියානු ජනරජයේ හරිත බලශක්ති අත්දැකීම් ඇසුරින්, හරිත බලශක්ති ආයෝජන ප්‍රවර්ධනය, පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංක්‍රාන්ති ක්‍රියාමාර්ග සඳහා අදාළ ප්‍රතිපත්තිමය රාමු, මූල්‍යකරණ ක්‍රමවේද සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් පිළිබඳ දැනුම.

හරිත ඉන්ධන සහ වරාය හරිතකරණය පිළිබඳ නෙදර්ලන්තයේ දැනුම් හුවමාරු වැඩසටහන	1	ජුනි 16 – 20	විදේශීය	53,595.35	විදේශයක	නෙදර්ලන්තයේ හරිත ඉන්ධන, වරාය හරිතකරණය සහ තිරසාර වරාය සංවර්ධනය සඳහා වන හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
සර්වසාමාවේශී දේශගුණික ප්‍රතිපත්ති හා සැලසුම්කරණය සඳහා ධාරිතා සංවර්ධන සහ උපදේශන වැඩමුළුව	1	ජූලි 14 – 15	විදේශීය	23,069.37	විදේශයක	දේශගුණික ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය පිළිබඳ ධාරිතා සංවර්ධනය හා දැනුම ලබා ගැනීම
SASEC උපකලාපයේ විදුලි උපකරණ සඳහා කලාපීය සැපයුම් හා වටිනාකම් දාම සංවර්ධනය ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව (නව දිල්ලිය, ඉන්දියාව)	1	ජූලි 23 – 27	විදේශීය	30,856.32	විදේශයක	විද්‍යුත් උපකරණ කර්මාන්තයට අදාළ කලාපීය සැපයුම් දාම හා වටිනාකම් දාම සංවර්ධනය සඳහා වන හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
වැඩසටහන් කණ්ඩායමේ සවිබල ගැන්වීම සඳහා අධ්‍යයන හා ඉගෙනුම් සංචාරය	1	ජූලි 28 – අගෝස්තු 01	විදේශීය	46,230.24	විදේශයක	ප්‍රායෝගික අත්දැකීම් සහ සමවයස් ඉගෙනුම් මගින් හොඳම භාවිතයන්, ආයතනික ඉගෙනුම්, වැඩසටහන් කළමනාකරණය, කණ්ඩායම් ක්‍රියාකාරීත්වය සහ ධාරිතා සංවර්ධන ප්‍රවේශයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
ශාස්ත්‍රපති උපාධි වැඩසටහන	1	2025 අගෝස්තු 13 – 2026 දෙසැම්බර් 18	විදේශීය	125,249.75	විදේශයක	අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ උසස් මට්ටමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීම
ප්‍රවාහන සම්බන්ධතා සඳහා වූ BIMSTEC ප්‍රධාන සැලැස්මේ මධ්‍යකාලීන සමාලෝචනය සඳහා දෙවන වැඩමුළුව	1	අගෝස්තු 13 – 14	විදේශීය	30,710.00	විදේශයක	BIMSTEC ප්‍රවාහන සම්බන්ධතා ප්‍රධාන සැලැස්මේ මධ්‍යකාලීන සමාලෝචනය, ප්‍රගති ඇගයීම සහ කලාපීය ප්‍රවාහන සම්බන්ධතා වර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම
ආසියාව සහ පැසිෆික් කලාපයේ දේශගුණික මූල්‍යකරණය පිළිබඳ කලාපීය සංවාදය	1	අගෝස්තු 25 – 29	විදේශීය	34,294.82	විදේශයක	ආසියානු සහ පැසිෆික් කලාපයේ දේශගුණික මූල්‍යකරණය, මූල්‍ය යාන්ත්‍රණ සහ දේශගුණික ආයෝජන අවස්ථා පිළිබඳ දැනුම ලබා ගැනීම
මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන (MTCP) යටතේ ජාත්‍යන්තර සහභාගිවන්නන් සඳහා වූ සාකච්ඡා කුසලතා පුහුණු පාඨමාලාව	1	සැප්තැම්බර් 08 – 17	විදේශීය	90,885.46	විදේශයක	මැලේසියානු තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ ජාත්‍යන්තර සහයෝගීතාව, දැනුම් හුවමාරුව සහ වෘත්තීය කුසලතා සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම

ජාත්‍යන්තර සහභාගිවන්නන් සඳහා රාජ්‍යතාන්ත්‍රික පුහුණු පාඨමාලාව	1	ඔක්තෝම්බර් 07 – 16	විදේශීය	92,602.19	විදේශයක	ගෝලීය මට්ටමේ සාර්ථක සහයෝගීතාව සහ සම්බන්ධතා වර්ධනය සඳහා ජාත්‍යන්තර සබඳතා, රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර නීතිමය රාමු, සාකච්ඡා හා ගිවිසුම් කළමනාකරණ කුසලතා සහ අන්තර්සංස්කෘතික සන්නිවේදන ක්‍රමවේද පිළිබඳ දැනුම
හවුල්කාර රටවල රාජ්‍ය නිලධාරීන් සඳහා 31 වන EDCF වාර්ෂික වැඩමුළුව	1	නොවැම්බර් 03 – 08	විදේශීය	167,730.88	විදේශයක	සංවර්ධන සහයෝගීතාව, සහනදායී ණය මූල්‍යකරණය, ව්‍යාපෘති ඇගයීම සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
ශ්‍රී ලංකාව සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	1	නොවැම්බර් 08 – 15	විදේශීය	146,523.37	විදේශයක	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති, මූල්‍ය විනය පවත්වා ගැනීම, අයවැය සැලසුම්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන් සහ රාජ්‍ය අංශයේ මූල්‍ය වගවීම හා විනිවිදභාවය පිළිබඳ දැනුම ලබා ගැනිම.
ආයෝජන ව්‍යාපෘතිවල ආර්ථික විශ්ලේෂණය පිළිබඳ දකුණු ආසියානු කලාපීය පුහුණු වැඩමුළුව	1	නොවැම්බර් 10 – 13	විදේශීය	38,890.37	විදේශයක	ආර්ථික ඇගයීම් ක්‍රමවේද, පිරිවැය–ප්‍රතිලාභ විශ්ලේෂණය, සහ රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවල ශක්‍යතාව හා කාර්යක්ෂමතාව ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා ගැනීම.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තරුණ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය	3	නොවැම්බර් 25 – දෙසැම්බර් 08	විදේශීය	384,401.79	විදේශයක	නවක රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවේද, විදේශ ප්‍රතිපත්ති ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සබඳතා සහ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රොටෝකෝල පිළිබඳ දැනුම ලබා ගැනීම
හරිත හා කාර්යක්ෂම වරාය සම්බන්ධතා ආයෝජන සම්මන්ත්‍රණය	1	දෙසැම්බර් 02 – 05	විදේශීය	54,565.77	විදේශයක	තිරසාර වරාය සංවර්ධනය, හරිත සැපයුම් කළමනාකරණය, වරාය සම්බන්ධතා කාර්යක්ෂම කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ආයෝජන උපායමාර්ග පිළිබඳ දැනුම ලබා ගැනිම
එක්සත් රාජධානියේ සංරක්ෂණ ඉගෙනුම් සතිය	2	දෙසැම්බර් 09 – 13	විදේශීය	126,061.42	විදේශයක	පරිසර සංරක්ෂණය, තිරසාර ස්වභාවික සම්පත් කළමනාකරණය සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
නව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	1	ජුනි 12	දේශීය	14,000.00	දේශිය	යාවත්කාලීන රාජ්‍ය ප්‍රසම්පාදන නීතිරීති, ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ අනුකූලතා අවශ්‍යතා පිළිබඳ දැනුම ලබා ගැනීම
රැකියා ස්ථානයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා Google යෙදුම් සහ කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම් – කණ්ඩායම 01	7	ජුලි 04	දේශීය	52,500.00	දේශිය	කාර්ය සාධනය, ඵලදායිතාව සහ කණ්ඩායම් සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා Google Workspace සහ කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම් භාවිතා කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම

ආරක්ෂිත, විද්‍යාත්මක හා ආර්ථිකමය රියදුරුකරණය	3	ජුලි 24	දේශීය	18,000.00	දේශීය	ආරක්ෂිත රියදුරු කුසලතා, මාර්ග ආරක්ෂාව සහ ආර්ථිකමය වාහන ධාවන ක්‍රමවේද පිළිබඳ දැනුම ලබා ගැනීම
උසස් MS Excel පිළිබඳ වැඩමුළුව – කණ්ඩායම 01	6	ජුලි 17, 18	දේශීය	84,000.00	දේශීය	උසස් Excel කාර්යයන් සහ දත්ත විශ්ලේෂණය පිළිබඳ දැනුම
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	2	ජුලි 29, 30, 31	දේශීය	36,000.00	දේශීය	ලේඛන හා වාර්තා කළමනාකරණය, ගොනු සංවිධානය සහ වාර්තා පවත්වාගෙන යාමේ හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
ප්‍රසම්පාදන ලේඛන පිළිබඳ සම්මන්ත්‍රණය	4	අගෝස්තු 05	දේශීය	50,000.00	දේශීය	ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීමේ ක්‍රියාවලිය, ලංසු ඇගයීම සහ අදාළ අනුකූලතා අවශ්‍යතා පිළිබඳ වැඩිදියුණු වූ අවබෝධය සහ දැනුම ලබා ගැනීම
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව	4	අගෝස්තු 09	දේශීය	74,000.00	දේශීය	නව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ඒවායේ විධිවිධාන සහ රාජ්‍ය ආයතන තුළ ප්‍රායෝගිකව යෙදවීම පිළිබඳ වැඩිදියුණු වූ අවබෝධය හා දැනුම ලබා ගැනිම
ලිපි ලේඛන සකස් කිරීම පිළිබඳ වැඩමුළුව	1	අගෝස්තු 11	දේශීය	7,750.00	දේශීය	නිල සන්නිවේදන කටයුතු, වාර්තාකරණය සහ ලිපි හුවමාරුව සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා කුසලතා හා ප්‍රවීණතාව වැඩිදියුණු කිරීම
නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	1	අගෝස්තු 23	දේශීය	7,500.00	දේශීය	රාජ්‍ය අංශයේ නියමයන්, ප්‍රමිතීන් සහ කාර්යාලීය ක්‍රියාපටිපාටි අනුව නිල ලිපි සකස් කිරීමේ හා ලිපි ලේඛන සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.
රැකියා ස්ථානයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා Google යෙදුම් සහ කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම් – කණ්ඩායම 02	14	අගෝස්තු 25	දේශීය	105,000.00	දේශීය	කාර්ය සාධනය, ඵලදායිතාව සහ කණ්ඩායම් සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා Google Workspace සහ කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම් භාවිතා කිරීම පිළිබඳ දැනුම ලබා ගැනිම

උසස් MS Excel පිළිබඳ වැඩමුළුව – කණ්ඩායම 02	5	සැප්තැම්බර් 03, 04	දේශීය	70,000.00	දේශීය	උසස් Excel ක්‍රියාකාරකම්, දත්ත විශ්ලේෂණ ක්‍රමවේද සහ වාර්තාකරණ කුසලතා පිළිබඳ දැනුම ලබා ගැනීම
උසස් කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම්	3	සැප්තැම්බර් 16	දේශීය	22,500.00	දේශීය	කාර්යාලීය කාර්ය සාධනය, දත්ත විශ්ලේෂණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා උසස් කෘත්‍රිම බුද්ධි (AI) මෙවලම් යොදා ගැනීම පිළිබඳ දැනුම ලබා ගැනිම
රාජ්‍ය සේවා විනය ක්‍රියාපටිපාටිය	2	සැප්තැම්බර් 17, 18	දේශීය	30,000.00	දේශීය	රාජ්‍ය සේවයේ විනය පාලනයට අදාළ නීතිරීති, විනය පරීක්ෂණ ක්‍රියාවලීන් සහ විනයානුකූල ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම ලබා ගැනීම
ලංසු කැඳවීමේ ක්‍රියාවලිය පිළිබඳ සම්මන්ත්‍රණය	8	සැප්තැම්බර් 17	දේශීය	100,000.00	දේශීය	ලංසු ක්‍රියාවලිය, ප්‍රසම්පාදන නීතිරීති සහ අනුකූලතා අවශ්‍යතා පිළිබඳ දැනුම ලබා ගැනීම
උසස් MS Excel පිළිබඳ වැඩමුළුව – කණ්ඩායම 03	1	සැප්තැම්බර් 24, 25	දේශීය	14,000.00	දේශීය	උසස් Excel ක්‍රියාකාරකම්, දත්ත විශ්ලේෂණ ක්‍රමවේද සහ දත්ත මත පදනම් වූ වාර්තාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
උසස් MS Excel පිළිබඳ වැඩමුළුව – කණ්ඩායම 04	8	ඔක්තෝම්බර් 02 & 03	දේශීය	112,000.00	දේශීය	උසස් Excel ක්‍රියාකාරකම්, දත්ත විශ්ලේෂණය සහ කළමනාකරණ තීරණ ගැනීම සඳහා දත්ත මත පදනම් වූ වාර්තාකරණ ක්‍රමවේද පිළිබඳ දැනුම ලබා ගැනීම
2025 ජාතික තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය	2	ඔක්තෝම්බර් 14, 15 & 16	දේශීය	100,000.00	දේශීය	නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ප්‍රවණතා සහ ඩිජිටල් පරිවර්තනය පිළිබඳ දැනුම ලබා ගැනීම
වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුළුව	1	ඔක්තෝම්බර් 16	දේශීය	8,000.00	දේශීය	වැටුප් පරිවර්තනය, වැටුප් ව්‍යුහයන් සහ අදාළ ගණනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ දැනුම ලබා ගැනීම
ආදායම් බදු වගකීම ගණනය කිරීම	2	ඔක්තෝම්බර් 17	දේශීය	28,000.00	දේශීය	ආදායම් බදු ගණනය කිරීමේ ක්‍රමවේද, බදු නීතිරීති සහ ව්‍යවස්ථාපිත අනුකූලතා අවශ්‍යතා පිළිබඳ දැනුම ලබා ගැනීම
ඩිජිටල් ලිපිගොනු කළමනාකරණය සමඟ කාර්යාල පද්ධති පිළිබඳ වැඩමුළුව	2	ඔක්තෝම්බර් 21 & 22	දේශීය	30,000.00	දේශීය	නවීන කාර්යාල පද්ධති සහ ඩිජිටල් වාර්තා කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම

ලංසු ඇගයීම පිළිබඳ වැඩමුළුව	1	ඔක්තෝම්බර් 22	දේශීය	9,500.00	දේශිය	ලංසු ඇගයීම සඳහා භාවිතා කරන නිර්ණායක, ඇගයීම් ක්‍රමවේද සහ තීරණ ගැනීමේ ප්‍රවේශයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
රැස්වීම් හා සාකච්ඡා සඳහා සංග්‍රහ කටයුතු සංවිධානය කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ කා.සේ.සේ. සඳහා පුහුණු වැඩසටහන	9	ඔක්තෝම්බර් 11	දේශීය	84,500.00	දේශිය	රැස්වීම් සහ සාකච්ඡා සඳහා සංග්‍රහ පහසුකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ අදාළ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුම ලබා ගැනීම
ලංසු ඇගයීම පිළිබඳ සම්මන්ත්‍රණය	5	නොවැම්බර් 12	දේශීය	62,500.00	දේශිය	ලංසු ඇගයීමේ මූලධර්ම, ඇගයීම් නිර්ණායක සහ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
උසස් MS Excel පිළිබඳ වැඩමුළුව – කණ්ඩායම 05	2	නොවැම්බර් 24 & 25	දේශීය	28,000.00	දේශිය	ලංසු ඇගයීමේ මූලධර්ම, ඇගයීම් නිර්ණායක, විනිවිදභාවය සහ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
ප්‍රසම්පාදන සැලසුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය	1	දෙසැම්බර් 19	දේශීය	14,000.00	දේශිය	ප්‍රසම්පාදන සැලසුම්කරණ ක්‍රියාවලිය, කාලසීමා කළමනාකරණය සහ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේ සැලසුම් පිළිබඳ දැනුම
වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව	2	2025 දෙසැම්බර් 27 දින සිට 2026 දෙසැම්බර් 26 දින දක්වා වසරක කාලයක්	දේශීය	184,000.00	දේශිය	ප්‍රසම්පාදන සැලසුම්කරණ ක්‍රියාවලිය, කාලසීමා කළමනාකරණය සහ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේ සැලසුම් පිළිබඳ දැනුම ලබා ගැනිම
වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව	1	2025 දෙසැම්බර් 30 දින සිට 2026 දෙසැම්බර් 29 දින දක්වා වසරක කාලයක්	දේශීය	92,000.00	දේශිය	වෘත්තීය කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ඵලදායී සන්නිවේදනය කිරීමේ දැනුම සහ කුසලතා ලබා ගැනීම

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

7.1. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඒ වනවිට අයවැය ඇස්තමේන්තුව [illegible]	
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 1.3 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම)	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	වැන්දඹු විශ්‍රාම වැටුපේ අයිතිය පිළිබඳ ගැටලුවක් හේතුවෙන් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. එබැවින් නීතිමය කටයුතු අවසන් වූ පසු ඉතිරි මුදල පියවන බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දන්වා ඇත. සේවකයාගේ රාජකාරිය අත්හිටවීම හේතුවෙන් තවත් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. ලිඛිතව ගෙවීමට උපදෙස් දී ඇත	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි විධිවිධාන අනුව, නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබාගැනීම රජයේ පුහුණු ආයතන හරහා පමණක් සිදු කළ යුතු වේ. එබැවින්, එම ආයතන විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සීමිත වීම හේතුවෙන් පුහුණු අවස්ථා ද සීමා වී ඇත..	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම - 1

Annexure - 1

இணைப்பு - 1

ඇමුණුම 1 / இணைப்பு 1 / Annexure 1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටිපිඩී/ඒ/ඊආර්ඩී/එෆ්ඒ/2025/14 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 31 දින

RECEIVED
16 JUN 2026
[illegible]

ගණන්දීමේ නිලධාරී

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවමි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්: (1) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවා ඇත.

(2) ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (කා.දැ.ස.)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීපීඩී/ඒ/ඊආර්ඩී/එෆ්ඒ/2025/14 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක.. මගේ වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පුනරාවර්තන වැය විෂයයන් 14 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදනයන් සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.176,314,947 ක ඉතිරියක් පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 91 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

3.2 බැරකම් ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව 2025 දෙසැම්බර් 31 දිනට රු.464,330 ක බැරකම් වලට එළඹ තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත SA 92 අනුව CIGAS පද්ධතියට ඇතුලත් කර නොතිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 විදේශ ණය ගිවිසුම් වලට එළඹීම

2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය ලබා ගෙන තිබූ ව්‍යාපෘති ණය 755 න් ව්‍යාපෘති ණය 706 කට අදාළව පමණක් එම ණය ගිවිසුම්ගත වීමේදී ස්වාධිපත්‍යයේ මුක්තිය (Sovereign Immunity) අත්හැරීමට කටයුතු කර ඇති ආකාරය පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලැබී තිබුණි. ඒ අනුව ඉන් විදේශීය ව්‍යාපෘති ණය 114 කට අදාළ ණය ගිවිසුම් වල ස්වාධිපත්‍යයේ මුක්තිය විවිධ අයුරින් අත්හැරීමේ (Waiver of Sovereign Immunity) ඡේදයන් අන්තර්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

4.2 විදේශ ණය පොළී වරදවා තෙවන පාර්ශවයකට ගෙවීම් කිරීම

විදේශීය ණය ලබා ගැනීම් 04 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ණය පොළී ගෙවීමේදී USD 1,091,419 හෙවත් රු.මිලියන 333 ක් ණය හිමියන් නොවන තෙවන පාර්ශවයකට ගෙවීම් කර තිබූ බව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබුණි. මෙම වටිනාකම රජයේ මූල්‍ය ප්‍රකාශන වල විදේශීය ණය පොළී වියදම තුළ ඇතුළත් වී තිබුණි. තවද, 2026 ජනවාරි මාසයේද USD 1,418,011 ක් එලෙස තෙවන පාර්ශවයකට ගෙවා තිබූ අතර ඒ අනුව, තෙවන පාර්ශවයකට කරන ලද මුළු ගෙවීම USD 2,509,430 ක් වී තිබුණි.

4.3 විදේශ ණය සහ ප්‍රදාන ලබාගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2025 වර්ෂයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2025 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි වේ.

සංවර්ධන පාර්ශවකරුවන්	ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ප්‍රදාන ඇතුලත්ව (එ.ජ.ඩො. මිලියන)	සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව (එ.ජ.ඩො මිලියන)	විචලනය (එ.ජ.ඩො මිලියන)	විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (%)
ලෝක බැංකුව	331	169	(162)	(49)
ආසියානු සංවර්ධන බැංකුව	504	517	13	3
චීනය	42	-	(42)	(100)
ජපානය	97	19	(78)	(80)
කොරියාව	13	1	(12)	(92)
මැද පෙරදිග රටවල්	70	-	(70)	(100)
ඉන්දියාව	65	13	(52)	(80)
රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල්	37	3	(34)	(92)
International Fund for Agriculture Development	26	4	(22)	(86)
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	24	40	16	67
IMF	-	682	682	-
International Bank for Reconstruction and Development	-	32	32	-
European Investment Bank	-	9	9	-
Saudi Fund for Arab Economic Development	-	21	21	-
OPEC	-	64	64	-
	1,207	1,574	365	

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2025 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො මිලියන 1,207 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො මිලියන 1,574 ක් වීම හේතුවෙන් සත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො මිලියන 365 කින් එනම් සියයට 30 කින් පමණ වැඩි වී තිබුණි.

(ii) ආසියානු සංවර්ධන බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව යන සංවර්ධන පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙලින් සියයට 3 කින් සහ 67 කින් වැඩි වී තිබුණි.

(iii) ලෝක බැංකුව, ජපානය, කොරියාව, ඉන්දියාව, IFAD හා රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ලබා ගැනීමට අපේක්ෂා කල ප්‍රතිලබ්ධිවීම් පිළිවෙලින් සියයට 49, 80, 92, 80, 86 හා 92 කින් අඩු වී තිබුණි.

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමග පැවති එකඟතාවය අනුව ප්‍රතිලබ්ධි ලැබෙන බව අපේක්ෂා කළ හැකිව තිබුණද, සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට එය ඇතුළත් කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුවේ පරිගණක ජාල සර්වර් පද්ධතිය සංවර්ධනය කර නඩත්තු කිරීම පෞද්ගලික ආයතනයක් මගින් වසර තුනක වගකීම් කාලයක් සහිතව 2017 වර්ෂයේ සිට සිදු කර තිබූ අතර, එහි වගකීම් කාලය 2020 අප්‍රේල් 17 දිනෙන් අවසන් වී තිබුණි. ඉන් අනතුරුව එකී ආයතනය සමඟ සර්වර් පද්ධතියේ ඇති දෘඩාංග බලපත්‍රයන් හා මෘදුකාංග බලපත්‍රයන් අළුත් කිරීමට සහ නඩත්තු සේවාවන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, දෘඩාංග 03 ක් සඳහා වන බලපත්‍රයන් මාස 06 ක කාලසීමාවකට හා මෘදුකාංග 03 ක් සඳහා වන බලපත්‍රයන් වර්ෂයක කාලසීමාවකට අළුත් කිරීම වෙනුවෙන් රු. 6,929,522 ක්ද, අදාළ දේශීය නඩත්තු කටයුතු වෙනුවෙන් 2025 සැප්තැම්බර් 31 දක්වා වූ මාස 06 ක කාලයක් සඳහා රු. 923,077 ක් සහ වැට් බදු වෙනුවෙන් රු. 1,413,468 ක් වශයෙන් එකතුව රු. 9,266,067 ක් එම ආයතනයෙන් ලද මිළ කියුමක් (Quotation) මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අනුව 2025 ජුලි 16 දින මෘදුකාංග සංවර්ධන වැය විෂය යටතේ ගෙවීම් කර තිබුණි. එමෙන්ම, දෘඩාංග 03 ක් සඳහා වන බලපත්‍රයන් තවත් මාස 06 ක කාලසීමාවකට අළුත් කිරීම වෙනුවෙන් රු. 5,926,608 ක් සහ වැට් බදු වෙනුවෙන් රු.1,066,790 ක් වශයෙන් එකතුව රු. 6,993,398 ක් එම ආයතනයෙන්ම ලද මිළ කියුමක් මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අනුව, 2025 දෙසැම්බර් 15 දින මෘදුකාංග සංවර්ධන වැය විෂය යටතේ ගෙවීම් කර තිබුණි. 2020 අප්‍රේල් 17 දිනෙන් පසුව ලංසු කැඳවීමකින් තොරව එම ආයතනයෙන් ලද මිළ කියුමක් මත බලපත්‍ර අළුත් කිරීම සහ දේශීය නඩත්තු කටයුතු සේවා ලබා ගැනීම 2025 වර්ෂය දක්වාම සිදු කර තිබූ බව නිරීක්ෂණය වූ අතර 2020 අප්‍රේල් 17 සිට 2021 මැයි 08 දක්වා වූ කාලසීමාව සඳහා එළඹී සේවා සහ නඩත්තු සහාය ගිවිසුම හැර අනෙකුත් කාලසීමාවන් සඳහා එවැනි ලිඛිත ගිවිසුමකට එළඹ වී ඇති බව නිරීක්ෂණය නොවීය. තවද, 2025 සැප්තැම්බර් 31 දිනෙන් පසු කාලසීමාව සඳහා සර්වර් පද්ධතියේ දේශීය නඩත්තු කටයුතු වෙනුවෙන් කිසිදු සේවාවක් ලබා ගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 136 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 106 ක් වූයෙන් පුරප්පාඩු 30ක් පැවතුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 01 ක්ද සහ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 09 ක් ඇතුලත් විය.

(ආ) කෙසේ වුවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 03 දෙනෙකු විදේශ නිවාඩු ලබාගෙන තිබූ අතර ඉන් එක් අයෙකු 2025 අගෝස්තු 13 දින සිට 2026 දෙසැම්බර් 18 දින දක්වා ලබාගෙන ඇති වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය 2026 මැයි 20 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට